17
16

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/02/Notice/D/Div.S/2022 | |
| ඔබේ අංකය<br>உமது இல<br>Your No | | |
| දිනය<br>திகதி<br>Date | 2022.11. 24 | |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## තේරීම් කමිටුවල කාර්ය පහසු කරලීම සඳහා සහාය සේවා ලබා ගැනීම

2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 10 වන වගන්තිය අනුව හා 2022 අංක 1 දරණ සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ (ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම) නියෝගයේ විධි විධාන අනුව පත් කරනු ලබන තේරීම් කමිටුවල ගණන් ගැනීමේ නිළධාරියා ලෙසින් කටයුතු කරන සාමාජිකයා අදාළ වසමේ ග්‍රාම නිළධාරි, ආර්ථික සංවර්ධන නිළධාරි හෝ සමෘද්ධි සංවර්ධන නිළධාරි හෝ වෙනත් නිළධාරියෙකු විය හැකිය. පනතේ 8 වන වගන්තිය අනුව ඔබට පැවරූ බලතල හා පනතේ 15 වන වගන්තිය අනුව වූ ඔබගේ කාර්යයන් ප්‍රකාරව තේරීම් කමිටුවල කාර්ය පහසු කරලීම සඳහා අවස්ථාවෝචිතව පහත පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

02. තේරීම් කමිටුවේ ගණන් ගැනීමේ නිළධාරියා වන තුන්වන සාමාජිකයා ග්‍රාම නිළධාරි, ආර්ථික සංවර්ධන නිළධාරි, සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගෙන් කෙනෙකු වන විට ඉතිරි නිළධාරීන් දෙදෙනාගේ සහාය තේරීම් කමිටුව වෙත ලබා ගැනීමට කටයුතු කළ හැකිය.

03. තුන්වන සාමාජිකයා වසමෙහි රාජකාරි සිදු කරන නිත්‍ය නිළධාරීන් වන ග්‍රාම නිළධාරි, ආර්ථික සංවර්ධන නිළධාරි හෝ සමෘද්ධි සංවර්ධන නිළධාරි නොවන අවස්ථාවලදී එම නිළධාරීන් තිදෙනාගේ සහාය තේරීම් කමිටුව වෙත ලබා ගැනීමට කටයුතු කළ හැකිය.

04. මේ සම්බන්ධයෙන් පහත උදාහරණ වෙත ඔබගේ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

උදාහරණ :

a) තේරීම් කමිටුවේ තුන්වන සාමාජිකයා එම ග්‍රාම නිළධාරි වසමෙහි ග්‍රාම නිළධාරියා වන අවස්ථාවේදී එම වසමෙහි රාජකාරි සිදු කරන ආර්ථික සංවර්ධන නිළධාරියා සහ සමෘද්ධි සංවර්ධන නිළධාරියා යන දෙදෙනාගේ සහාය තේරීම් කමිටුව වෙත නිරීක්ෂණ මට්ටමින් ලබා ගත හැකිය.
b) තේරීම් කමිටුවේ තුන්වන සාමාජිකයා එම ග්‍රාම නිළධාරි වසමෙහි ආර්ථික සංවර්ධන නිළධාරියා වන අවස්ථාවේදී එම වසමෙහි රාජකාරි සිදු කරන ග්‍රාම නිළධාරියා සහ සමෘද්ධි සංවර්ධන නිළධාරියා යන දෙදෙනාගේ සහාය තේරීම් කමිටුව වෙත නිරීක්ෂණ මට්ටමින් ලබා ගත හැකිය.